**ශීර්ෂය 326 - ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-----------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරනය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනුලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් වියහැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන පලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වැදරවාදැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම් කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 මාර්තු 18 වන දින මහා භාණ්ඩාගාරය විසින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබා දුන් රු.2,184,268 ක් වටිනා මෝටර් රථයක කල්බදු කාලය අවසන්ව ඇතත් එහි අයිතිය ආයතනයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් පවරාගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතු වේ. | කොවිඩ් - 19 වතාවරණය අනුව නියමිත කාලය තුළ දී කල්බදු අවසන් කර රථය පවරා ගැනීමට නොහැකි විය. |

### 1.6.2 තැන්පතු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තැන්පතු ගිණුම් දෙකකට අදාලව වර්ෂ 2 ක ඉක්මවූ රු.88,250 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 6000-0-012-0-145 එකඟ වෙමි. මෙම තැන්පතු ගිණුමේ රඳවා ඇති රු.250 ක මුදල 2020.06.30 දිනට පෙර රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමි.<br>6000-0-0-19-0-29 ප්‍රජා විශෝධනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයක් නිර්මාණය කිරීම සඳහා තැන්පතු ගිණුමේ රු.88,000 ක මුදල රඳවා ගන්නා ලදි. මේ වන විට එය සකස් කර නිම කර ඇති අතර මුද්‍රණය කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. |

**1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම | | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i). | මුදල් රෙගුලාසි 214 | බැරකම් පිළිබඳ ලේඛන නිතිපතා පරීක්ෂා කර බැලිය යුතු වුවත්, රු.1,771,420 ක ගමන් වියදම් 2020 ජුනි 17 දින වනවිටත් නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ගමන් වියදම් වෙනුවෙන් වූ බැරකම් මේ වන විට නිරවුල් කරමින් සිටි. |
| (ii). | මුදල් රෙගුලාසි 447(7) | 1201 වැය විෂයයට අදාල වැය ලේජර් පිටුව 2019 දෙසැම්බර් 31 දිනට තුළනය කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii). | මුදල් රෙගුලාසි 565(2) හා (4) | තැන්පතු සඳහා ආපසු ගෙවීම් කිරීමේදී, ලැබීම් තීරුවේ ගෙවීම් සිදු කළ දිනයත් ගෙවීම් තීරුවෙහි එම තැන්පතුව සිදු කළ දිනයත් සටහන් කර නොතිබුණු අතර ආරම්භක ශේෂ තහවුරු කර ගැනීම සඳහා බලයලත් මාණ්ඩලික නිලධාරියෙකු කෙටි අත්සන් යොදා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | **රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ** | | | |
| | **2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන චක්‍රලේඛයේ 7(ii) ඡේදය** | ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් එකතු කර තිබූ රු.10,595,473 ක් ඒසීඒ - 3 ආකෘතියේ ඇතුලත් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 වියදම් කළමනාකරණය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පුනරාවර්ථන වැය විෂයයන් 06 ක් සඳහා සලසා ගෙන තිබූ රු.25,700,000 ක ප්‍රතිපාදනවලින් රු.8,525,000 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබූ අතර එම මාරු කර තිබූ ප්‍රතිපාදන ද ඇතුළත්ව සියයට 50 ක් එනම් රු.12,825,278 ක ප්‍රතිපාදන අරමුණුගත කාර්යයන් සඳහා වැය කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව තාත්වික වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතු වේ. | අප්‍රේල් මස පාස්කු ප්‍රහාරය නිසා ප්‍රාදේශීය කාර්යාල පරීක්ෂාව හා ප්‍රගති සමාලෝචිත රැස්වීම සඳහා සහභාගීවීම අවමවීම, වැඩසටහන් රැසක් අවලංගු කිරීමට සිදු වීම, භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිලධාරීන්ගේ ඉල්ලීම අවමවීම යන හේතු නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (ආ) පුනරාවර්ථන වැය විෂයයන් 02 ක් සඳහා සලසා ගෙන තිබූ රු.3,272,000 ක පරිපූරක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිව තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව තාත්වික වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතු වේ. | ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (ඇ) පුනරාවර්ථන වැය විෂයයන් 04 ක් සඳහා මුදල් රෙගුලාසි 66/69 යටතේ මාරු කර තිබූ රු.6,144,000 ක ප්‍රතිපාදනවලින් රු.2,617,758 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීමෙන් ඉතිරිව තිබූ අතර එම ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 31 සිට සියයට 82 දක්වා වූ පරාසයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව තාත්වික වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතු වේ. | ගෙවීමට නියමිත ගමන් වියදම් වවුචර් 2019.12.31 දින වන විටත් ලැබී නොතිබීම හා ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (ඈ) මූලධන වැය විෂයයන් 04 ක් සඳහා සලසා ගෙන තිබූ රු.8,450,000 ක ප්‍රතිපාදනවලින් රු.2,000,000 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබූ අතර එම මාරු කර තිබූ ප්‍රතිපාදන ද ඇතුළත්ව සියයට 66 ක් එනම් රු.5,618,179 ක ප්‍රතිපාදන අරමුණු ගත කාර්යය සඳහා වැය කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව තාත්වික වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතු වේ. | (i). අයවැය චක්‍රලේඛ 05/2019 අනුව සියයට 10 ප්‍රතිපාදන ඉතිරිකිරීම, මනා නඩත්තුවකින් හා පාලනයකින් යුක්තව යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ භාවිතය නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත.<br>(ii). ඇස්තමේන්තු පිළියෙල |

| | | | |
|---|---|---|---|
| | | | කිරීමේ වරදකින් සිදු වූ වරද මු.රෙ. 66 මගින් 2102 වැය විෂය යටතට මාරු කිරීම හා අක්මුදල් නොලැබීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය. |
| (ඉ) | 326-1-1-2001 වැය විෂයය සඳහා මුදල් රෙගුලාසි 66/69 යටතේ මාරු කර තිබූ රු.2,050,000 ක ප්‍රතිපාදනවලින් සියයට 51 කට වැඩියෙන් එනම් රු.1,050,624 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව තාත්වික වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතු වේ. | 2019.12.31 දින වන විටත් අදාල වියදම් සිදු කර නොතිබීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරිවී ඇත. |
| (ඊ) | පුනරාවර්ථන වැය විෂයයන් 02 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනය වූ රු.106,000,000 කින් බැරකම් හා බැදීම් ඇතුළුව රු.86,480,878 ක මුළු වියදමක් පමණක් දරා එම වැය විෂයයන් හි ප්‍රතිපාදනවලින් රු.12,830,000 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. තවත් පුනරාවර්ථන වැය විෂයයන් 04 ක රු.12,750,000 ක්වූ ඇස්තමේන්තු ප්‍රතිපාදනය ඉක්මවා බැරකම් හා බැදීම් ඇතුළුව රු.21,120,749 ක වියදම් දරා එම වැය විෂයයන් සඳහා මුදල් රෙගුලාසි 66/69 යටතේ රු.6,144,000 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ගෙන් මාරු කර තිබුණි. ඒ අනුව වැය විෂයයන් 06 ක ඇස්තමේන්තු තාත්වික පදනමකින් පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව තාත්වික වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතු වේ. | ඇස්තමේන්තු කළ ප්‍රතිපාදනය ඉක්මවා අයවැය මගින් ප්‍රතිපාදන ලැබී තිබීම, 001-2-6-6-2507 වැය විෂය යටතේ ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ප්‍රතිපාදන ලැබීම, පාස්කු ප්‍රහාරය හේතුවෙන් වැඩසටහන් රැසක් අවලංගු කිරීම නිසා මෙම වැය විෂයයේ ප්‍රතිපාදන ඉතිරි විය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ රු.6,280,970 ක බැදීම් හා බැරකම් වටිනාකම භාණ්ඩාගාර පොත් අනුව රු.5,220,124 ක් වීමෙන් රු.1,060,846 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා 2020 වර්ෂයේ දී ගෙවීම් සිදු කර තිබුණි. | නිසිපරිදි වියදම් කළමනාකරණය කළ යුතු වේ. | අක්මුදල් නොලැබීම නිසා ගෙවීමට නොහැකි වූ මෙම වියදම්, අත්‍යාවශ්‍යම වියදම් වීම හේතුවෙන් 2020 වර්ෂය තුළ දී ගෙවීම් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | වාර්ෂිකව පුනරාවර්ථනය වන සේවාවන් හෝ සැපයුම් නොවන අතිකාල සහ නිවාඩු දින වැටුප් හා දේශිය ගමන් වියදම්වල එකතුව වන රු.1,930,469 ක් 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයෙහි 94(2) හා (3) ප්‍රකාරව එළඹෙන ලද බැදීම් ප්‍රකාශයේ ඇතුළත් කර තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතු වේ. | අතිකාල නිවාඩු දින වැටුප් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් වූ අතර දේශිය ගමන් වියදම් ඉදිරි වර්ෂයේ දී නිවැරදිව සිදු කිරීමට කටයුතු කරමි. |

**2.3 අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැඩතහනමට ලක් වී වර්ෂ 8 කට අධික කාලයක් ගතවුවද විනය පරීක්ෂණ කටයුතු කාර්යක්ෂම ලෙස කඩිනම්ව සිදු නොවීමත්, ඉකුත් වර්ෂයේ විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ විශ්‍රාම පාරිතෝෂිතය ලබා නොදීමත් හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.174,880 ක ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර ණය ආපසු අයකර ගත යුතු වීම. | විනය පරීක්ෂණ කටයුතු අවසන් වූ වහාම අයකර ගැනීමට කටයුතු කරමි. |

**3. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විධායක මට්ටමේ තනතුරු 13 ක් පුරප්පාඩු වීම මත නිලධාරීන් 633 ගේ පරිපාලන කටයුතු නිසිආකාරව පවත්වාගෙන යාමටත් ප්‍රජා විශෝධන නිලධාරීන් හා වැඩ පරීක්ෂක තනතුරු 31 ක් පුරප්පාඩු වීමෙන් ප්‍රාදේශිය කාර්යාල නිසි පිරිදි ක්‍රියාත්මක නොවීමත් හා සංවර්ධන නිලධාරී තනතුරු 39 ක් පුරප්පාඩු වීමෙන් ආඥාලාභීන්ගේ පසුවිපරම් කටයුතු නිසිපරිදි සිදු නොවීමත් හේතුවෙන් දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී බාධා මතු වී තිබුණි. | ඉහළ කළමනාකරණය විසින් අදාල ආයතන සමග සම්බන්ධ වී අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කල යුතු වේ. | අවස්ථා ගණනාවකදීම අදාල ආයතන වෙතින් පුරප්පාඩු පිරවීම සිදු කරන ලෙස ඉල්ලීම් කර ඇත. |